# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2220/35 - 2021 මාර්තු මස 23 වැනි අඟහරුවාදා - 2021.03.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සුරාබදු ආඥාපනත**

සුරාබදු නිවේදනය

**ස්ටිකර සහ ස්ටිකර කළමනාකරණ පද්ධතිය**

සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරිය වූ) 8 වන සහ 30 වන වගන්තිය සමග කියවිය යුතු 32 වන වගන්තියෙන් මුදල් විෂයභාර අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 ජුනි 20 දිනැති අංක 2128/30 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද අංක 04/2019 දරන සුරාබදු නිවේදනය සංශෝධනය කරන ලද පරිදි, පහත රීති පනවන අංක 2147/75 දරන 2019 නොවැම්බර් 01 දිනැති *ගැසට් පත්‍රයේ* පළකරන ලද අංක 06/2019 දරන සුරාබදු නිවේදනය, 2020 සැප්තැම්බර් 10 දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. 3 වන රීතිය,

   (අ) පළමු අතුරුවිධානය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අතුරුවිධානය ආදේශ කිරීමෙන් :

   ''එසේම,

   (i) ආනයනකරුවකු, 2019 සැප්තැම්බර් 20 වන දිනට පෙර, සහ

   (ii) බලපත්‍රලාභී නිෂ්පාදකයකු, 2020 ජුනි 01 වන දිනට පෙර,

   දැනටමත් පවතින, II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය තොගයක් මත ස්ටිකරයක් ඇලවීමට පියවර ගත යුතු ය.'' සහ

   (ආ) දෙවන අතුරුවිධානය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අතුරුවිධානය ආදේශ කිරීමෙන් :

   ''එසේම තවදුරටත්,

   (i) ආනයනික විදේශීය මත්පැන් සම්බන්ධයෙන් වන විට, 2019 සැප්තැම්බර් මස 20 වන දිනට පෙර, සහ

   (ii) දේශීයව නිෂ්පාදිත විදේශීය මත්පැන් සහ දේශීය මත්පැන් සම්බන්ධයෙන් වන විට, 2020 ජුනි 01 වන දිනට පෙර,

   II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් ද්‍රව්‍ය තොගයක් ඇති වෙළෙන්දෙකු විසින් එකී සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය මත ස්ටිකරයක් ඇලවීමට පියවරගත යුතු ය.''

2. 13 වන රීතියෙහි සඳහන් ''දින හැටක් (60)'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''දින දෙසිය පනස් පහක් (255)'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.


**එස්. ආර්. ආටිගල,**
ලේකම්,
මුදල් අමාත්‍යාංශය.


2021 මාර්තු මස 23 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

04 - 500


1A - PG 5367 — 95 (2021/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*